# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE REACHING NATIONS

**India's National Spiritual Newspaper**


₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVIII | JANUARY 2024 | Issue No. 02

### ශුද්ධවූ බයිබලය

**(යෙරමියා 31:23-28)**

23. ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක: මා විසින් ඔවුන්ගේ වාල්කම පහකළ කල්හි යූදා දේශයෙහිද එහි නුවරවලද මනුෂ්‍යයන්- එම්බා ධර්මිෂ්ඨකමේ වාසභූමිය, එම්බා ශුද්ධකමේ කන්ද, නුඹට ස්වාමීන්වහන්සේ ආශීර්වාදකරනසේක්වා යන කීම නැවත භාවිතාකරනවා ඇත.

24. එතැන්හි යූදා සහ එහි සියලු නුවරවල මනුෂ්‍යයෝද ගොවියෝද සිවුපා රැළ කැටුව යන්නෝද එක්ව වාසයකරන්නෝය.

25. මක්නිසාද මම විඩාවූ ආත්මය ප්‍රාණවත්කෙළෙමි, ශෝකවෙන සියලු ආත්මද සෑහීමට පැමිණවීමි.

26. එවිට මම පිබිද බැලුවෙමි; මාගේ නින්ද මට මිහිරිව තිබුණේය.

27. බලව, මම ඉශ්‍රායෙල් වංශයද යූදා වංශයද නැමති කෙත්වල මනුෂ්‍ය බීජ සහ මෘග බීජද වපුරන දවස් පැමිණෙන්නේයයි ස්වාමීන්වහන්සේ කියනසේක.

28. තවද මම උදුරන්ටත් කඩාදමන්ටත් හෙළාදමන්ටත් නැතිකරන්ටත් විපත්ති පමුණුවන්ටත් ඔවුන් ගැන පිබිද සිටියාක්මෙන්ම ගොඩනගන්ටත් හිටවන්ටත් ඔවුන් ගැන පිබිද සිටින්නෙමියි ස්වාමීන්වහන්සේ කියනසේක.

# ඔබව මාගේ යහපත්කමින් තෘප්තියට පැමිණෙන්නේය!

*කියා ස්වාමීන්වහන්සේ පවසන සේක. (යෙරමියා 31:4)*

## YOU SHALL BE SATISFIED WITH MY GOODNESS!

## says the Lord - Jeremiah 31:14.



2024 වන වර්ෂයේදී තමාට කුමක් වේවිදැයි කියා ඉතා ඕනෑකමින් බලා සිටින්නාවූ අයට දෙවියන්වහන්සේ මේ පණිවිඩය තුළින් කථා කරන්නේය.

(ප්‍රධාන කර්තෘ ඇන්ජලින් සෙල්ව කුමාරි)

කැඳවීමේ ප්‍රතිරාවයේ සාමාජිකයින් සියලු දෙනාටම ඉතා ප්‍රීතිමත් හා අසිරිමත් සුභ නව වසරක් වේවායැයි කියා ප්‍රාර්ථනා කරමි. පසුගිය කාලය පුරාවටම ඔබ කැඳවීමේ ප්‍රතිරාවය සේවයට දුන් සියලු උපකාරයන් නිසා අපි ඔබට ස්තුති වන්ත වෙමු. ස්වාමීන්වහන්සේගේ යහපත්කම කරණකොටගෙන අපට තවත්, නව වසරක් උන්වහන්සේ දී තිබේ. ඔබගේ නොකඩවා පවත්වාගෙන යන්නාවූ යාච්ඤාව හා ප්‍රේමයේ දීමනාවන් තුළින් ලෝකයේ සිටින්නාවූ දහස් ගණන් මනුෂ්‍යයන්ට දෙවියන්වහන්සේගේ පණිවිඩය ගෙන යාමට අපට හැකි වී තිබේ. එම නිසා ඔබගේ සියලු උපකාරයන් නිසා අපි ඔබට ස්තුතිවන්ත වෙමු. සැබැවින්ම ස්වාමීන්වහන්සේ ඔබට පමණක් නොව ඔබගේ මතු පරම්පරාවටම ආශිර්වාද කරන සේක. ඔබගේ කාලය හා ඔබගේ යාච්ඤාව ශුභාරංචිය ප්‍රකාශ කිරීමට යොමු කලහොත් දෙවියන්වහන්සේගේ

3 වෙනි පිටුවට ...

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)
REACHING NATIONS

*from your dearly beloved brother...*



# කැඳවීමේ ප්‍රතිරාවය



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Sis. L. Mariya Anjalin, M.A., M.Sc., B.Ed.
Rev. Dr. K.R. Rajasekaran

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

**"ඔබ ස්වකීය යහපත්කම නමැති ඔටුන්නෙන් අවුරුද්ද සරසනසේක...."**

**(ගීතාවලිය 65:11)**

**ස්වාමීන්වහන්සේ තුළ ප්‍රේමවන්ත සහෝදර සහෝදරිය,**

"අනුග්‍රහයෙන් සමාදානයත් නුඹලාට වැඩිවේවා..." (1 පේතෘස් 1:2)



*Pr. Alex Samson Sam*
*Managing Editor*

මෙම කතු වැකිය තුළින් මා හට යමක් ලිවීමට අවස්ථාව ලැබීම ගැන මා දෙවියන්වහන්සේට ස්තුති කරමි. මගේ පියා වූ එස්. සැම් සෙල්වරාජ් ඉතාම කාර්‍යයබහුලව බොහෝ ගමන්වල යෙදී සිටිමින් හා බොහෝ සේවාවන් වල යෙදී සිටින බැවින් මෙම කතු වැකිය ලිවීමේ වගකීම ඔහු මට භාර දී තිබේ. සැබවින්ම මා ඔබගේ ප්‍රේමය ගැනත් අප හා සමඟ ඔබ සේවයේ හවුල් වැඩකාරයින්ව සිටීම ගැනත් මා දෙවියන්වහන්සේට ස්තුතිවන්ත වෙමි.

2023 වර්ෂයේ දෙසැම්බර් මාසය තුල බොහෝ පුද්ගලයින් මුණගැසීමටත් බොහෝ අයට දෙවියන්වහන්සේ ගැන කියා දීමටත් දෙවියන්වහන්සේ අපට බොහෝ ඉඩ ප්‍රස්ථාවන් ලබා දුන්නේය. අපගේ අලුත් අවුරුදු දේව මෙහෙය දෙවියන්වහන්සේගේ ආශිර්වාදයෙන් පිරී තිබුණි. එසේම 2024 වන වර්ෂය ඔබටත් ඔබගේ පවුලටත් ඉතාම ඵලදායී ආශිර්වාදමත් වසරක් වන බව අපි විශ්වාස කරමු.

කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ YouTube චැනලය හරහා විකාශනය වන අපගේ දිනපතා මෙනෙහි කිරීමේ කාලයට ඔබත් දිගටම දිනපතාම සහභාගී වීම ගැන අපගේ සතුට ප්‍රකාශ කරමු. එසේම දැනට ඉංග්‍රීසි, දෙමළ හා තෙළිඟු භාෂාවන්ගෙන් මෙය විකාශනය වන අතර ඉදිරියේදී අනෙකුත් භාෂාවන් වලින් මෙය විකාශනය කිරීමටද බලාපොරොත්තු වෙමු.



*Nehemiah Bible College Key Leaders*

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ දියුණුව සඳහා ඔබගේ යාච්ඤාව අපි බලාපොරොත්තු වෙමු. අපගේ නෙහෙමියා බයිබල් විදුහල ගැන මා යමක් පැවසීමට කැමැත්තෙමි. වර්ථමානයේදී දෙමළ හා හිංදි භාෂාවන්ගෙන් මෙය පවත්වාගෙන යන අතර මේ නව වසරේදී ඉංග්‍රීසි භාෂාවෙන්ද මෙම විදුහලේ ඉගැන්වීමේ කටයුතු කරගෙන යාමට සැලසුම් කරගෙන තිබේ. ආසියානු දේව ධර්මාචාර්‍යය සංවිධානය විසින් අපගේ බයිබල් විදුහල පිළිගැනීම පිණිස එයට අදාල සියලුම වැඩවල අවසාන කටයුතු දැනටම

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

සිදු කරමින් පවතී. දැනට අපට සාමාජික ලියාපදිංචිය ලැබී තිබේ. කරුණාකර අපගේ සියලුම සේවකයින් උදෙසා යාච්ඤා කරන්න.එසේම නෙහෙමියා බයිබල් විදුහල ඊළඟ පියවරට ගෙනයන පිණිස අප ඔබගේ යාච්ඤාව බලාපොරොත්තු වෙමු.

කරුණාකර භාෂා 16 කින් නිකුත්කරනු ලබන කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව ගැනද ප්‍රධාන සභාවේ තිබෙන සියලු දේව මෙහෙයන් නිසාද තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව නිසාද බයිබල් විදුහල මඟින් පවත්වාගෙන යනු ලබන තැපැල් මාර්ගික පාඩම් මාලාව නිසාද ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසල නිසාද අපගේ මුද්‍රණාලය නිසාද කරුණාකර යාච්ඤා කරන්න.

*"ස්වාමීන්වහන්සේ ඔබට ආශීර්වාදකොට ඔබ ආරක්ෂා කරන සේක්වා. ස්වාමීන්වහන්සේ ස්වකීය මුහුණ ඔබ කෙරෙහි බබළවා ඔබට කරුණා කරන සේක්වා. ස්වාමීන්වහන්සේ ස්වකීය මුහුණ ඔබ කෙරෙහි ඔසවා ඔබට සමාදානය දෙන සේක්වා. (ගණන් කථාව 6:24-26)*

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක

*Pr. Alex Samson Sam*
*Pr. S. Sam Selva Raj*

(+91) 98412 71858 / 98410 71858, E.mail : sam@echoofhiscall.org

*1 පිටුවෙන්....*

සෙනඟට උන්වහන්සේ දුන් පොරොන්දු උන්වහන්සේ ඔබටත් ඉෂ්ඨ කරන සේක. මෙම ගුහාරංචි සේවයට අප සියලුදෙනාම එක්සිත්ව අත්වැල් බැඳගනිමු.

මෙම නව වසර තුළ අපගේ යහපත් වූ දෙවියන්වහන්සේ ඔබට ප්‍රඥාවද දිව්‍යමය දැනගැන්මද නිරෝගීමත්කමද ශක්තිය හා සමාදානය දෙමින් උන්වහන්සේගේ යහපත්කමින් ඔබට තෘප්තියට පමුණුවන සේක. දේව වචනයෙහි මෙසේ පවසයි.

***"....මාගේ සෙනඟ මාගේ යහපත්කමින් තෘප්තියට පැමිණෙන්නෝය."*** කියා පවසයි. ***(යෙරෙමියා** 31:14)*

මේ නව වසරේදී අපට දී තිබෙන්නේ කෙතරම් අලංකාරවූ පොරොන්දුවක්ද! ***"මාගේ සෙනඟ තෘප්තියට පමුණුවන්ගේ මාගේම යහපත්කමින්"*** ය කියා ස්වාමීන්වහන්සේ පවසයි. මෙයින් අපට තේරුම් කර දෙනු ලබන්නේ අපට කිසිම හිඟකමක් නොමැතිව තෘප්තියට පත්වන්න කියාය. මාගේ දෙවියන්වහන්සේ මෙම වසරේදී මාගේ සියලු අවශ්‍යතාවයන් සපයන සේක. මෙම නව වසර තුළදී දෙවියන්වහන්සේගේ යහපත්කම අත්දැකීමෙන් තෘප්තියට පත්වෙන්නාවූ වසරක් වේවා. ***"....දෙවියන්වහන්සේ විසින් තමන් ප්‍රේම කරන්නන්ට සූදානම්කල යම් දෙයක් ඇද්ද ඒ දේ ඇසට නොපෙනුනේය. කනට නොඇසුණේය, මනුෂ්‍යයාගේ සිතට නොපැමින්නේය."*** *(1 **කොරින්ති** 2:9)* මේ ආකාරයට දෙවියන්වහන්සේ මේ නව වසර තුළ අපව ගෙනයන්නට යයි. ඔබ මේ ගැන සතුටුවන්නේ නැද්ද? මා නම් බොහෝ සෙයින් සතුටු වෙමි. මන්ද උන්වහන්සේ තම පොරොන්දු ඉෂ්ඨ කිරීමට විශ්වාසවන්තව සිටී.

## දෙවියන්වහන්සේගේ යහපත්කම

අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ දැනටමත් අපට බොහෝ යහපත් වූ දේ තුළින් ආශිර්වාද කර තිබේ. නමුත් යක්ෂයා මෙය අපගේ මනසින් ඉවත්කර අප වටා තිබෙන අනෙකුත් දේ දෙස බලන පිණිස ක්‍රියා කරමින් සිටී. අප දෙවියන්වහන්සේගේ යහපත් වූ ආශිර්වාද ගැන පමණක් බලමින් ජීවත් විය යුතුය. දෙවියන්වහන්සේ ආදම් සහ ඒවට ඒදන් උයනෙහිදී ආශිර්වාද කලේය.

මෙම ඒදන් උයනේ දී සිදුවූ කාරණය ගැන අප මොහොතක් මෙනෙහිකර බලමු. ආදම් සහ ඒවට දෙවියන්වහන්සේ ආශිර්වාද කල බව මෙහි සඳහන් කරයි.

*"තවද දෙවියන්වහන්සේ: අපගේ ස්වරූපයෙන් අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා සාදමිහ; ඔව්හු මුහුදේ මත්ස්‍යයන් කෙරෙහිද ආකාශයෙහි පක්ෂීන් කෙරෙහිද තිරිසනුන් කෙරෙහිද මුළු පොළොව කෙරෙහිද පොළොව පිට බඩගා යන සියල්ලන් කෙරෙහිද ආණ්ඩුකෙරෙත්වයි කීසේක.දෙවියන්වහන්සේ තමන් ස්වරූපයෙන් මනුෂ්‍යයා මැවූසේක, දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් ඔහු මැවූසේක; පුරුෂයාද ස්ත්‍රියද කොට ඔවුන් මැවූසේක. දෙවියන්වහන්සේ ඔවුන්ට ආශීර්වාදකළසේක; දෙවියන්වහන්සේ ඔවුන්ට කියනසේක්: ඔබ සැම බෝවී වැඩිවෙමින් පොළොව පූර්ණකොට ඒක යටත් කර ගන්න; මුහුදේ මත්ස්‍යයන් කෙරෙහිද ආකාශයේ පක්ෂීන් කෙරෙහිද පොළොව පිට හැසිරෙන සියලු සතුන් කෙරෙහිද අධිපතිකම් කරව්.... දෙවියන්වහන්සේ තමන් සෑදූ සියල්ලම දුටුසේක, බලව ඒ ඉතා යහපත්ව තිබුණේය." (උත්පත්ති 1:26-28,31)*

උත්පත්ති 2:17 හි දෙවියන්වහන්සේ මෙසේ අණ කලේය. ***''එහෙත් යහපත හා නපුර දැනගැනීමේ ගහෙන් කන්ට එපාය; මක්නිසාද එයින් කෑ දවසෙහි ඒකාන්තයෙන් ඔබ නසින්නෙහිය.''***

දෙවියන්වහන්සේ මෙහිදී ප්‍රකාශ කරනු ලැබුයේ අපට සෑම දේම ආණ්ඩු කිරීමේ බලය තිබෙන බවයි. නමුත් අද ලෝකයේ තිබෙන්නාවූ සෑම දේම අපව ආණ්ඩු කරනු ලබයි. අපගේ දූරකථනය හා අද දියුණුව තිබෙන්නාවූ තාක්ෂනය පවා අපව පාලනය කරනු ලබයි.

යක්ෂයා දෙවියන්වහන්සේගේ වචනය නොපිටට හරවා මනුෂ්‍යයාට කථා කලේය. ***''නුඹලා ඇත්තටම නසින්නෙ නැත; මක්නිසාද නුඹලා එයින් කන දවසෙහි නුඹලාගේ ඇස් ඇරෙන බවත් ඔබ සෑම යහපත හා නපුර දැනගෙන දෙවියන්වහන්සේට සමාන වන බවත් දෙවියන්වහන්සේ දන්නාසේකැයි ස්තී‍්‍රට කීය.'' (උත්පත්ති 3:4-5)***

මෙහිදී යක්ෂයා ආදම්ටත් ඒවටත් දෙවියන්වහන්සේගේ වචනය වෙනස්කර 'නුඹලා මේ ගසෙන් කෑවොත් මැරෙන්නෙ නැහැ. නමුත් නුඹලා දෙවියන්වහන්සේ මෙන් වනු ඇත' කියා ඔවුන්ව නොමගට ඇරියේය අදටත් යක්ෂයා මනුෂ්‍යයන්ට මේ ක්‍රමය පාවිච්චි කර දෙවියන්වහන්සේගේ මාර්ගයෙන් නොමගට යවනු ඇත. ලෝකයේ දේවල් දෙවියන්වහන්සේගේ දේ වලට වඩා අති විශිෂ්ඨයි කියා පෙන්වයි.

නපුරාගේ හඬට ආදම් සහ ඒව ඇහුම්කන් දුන් විට ඔවුන්ගේ ජීවිතයේ වැදගත්ම දේ ඔවුන් අහිමි කර ගත්තේය.

***ඔවුන්ගේ ඇස් ඇරී ඔවුන් දෙදෙනාම නග්නව සිටින බව ඔවුන් දුටුවේය. තවද ඔවුන්ට තිබූ සමාදානය හා ප්‍රීතිය ඔවුන්ට නැති විය. ඔවුන් දෙවියන්වහන්සේට මුහුණදීමට බැරිව හැංගුනේය. (උත්පත්ති 3:7-10)***

***''යම් භූමියකින් ඔහු ගන්නාලදද එය වවන පිණිස ස්වාමිවූ දෙවියන්වහන්සේ ඒදන් උයනෙන් ඔහු පිටකළසේක.'' (උත්පත්ති 3:23) උන්වහන්සේ ආදම්ට කථාකොට: ඔබේ භාර්යාවගේ හඬට ඇහුම්කන්දී නොකන්ට මා අණකළ ගහෙන් කෑ බැවින් ඔබ නිසා භූමිය ශාපලද්දීය; ඔබේ ජීවිතයේ සියලු දවස්වලම ඔබ වෙහෙසින් යුක්තව එයින් කන්නෙහිය;එය ඔබට කටුද ගොකටුද උපදවන්නේය; ඔබ වනයේ පලා කන්නෙහිය.'' (උත්පත්ති 3:17-19)***

ඔවුන් දෙවියන්වහන්සේගේ යහපත්කම නැතිකර ගත්තේය. දෙවියන්වහන්සේ සමඟ තිබූ සම්බන්ධතාවය හා ප්‍රීතියද නැති කර ගත්තේය.

දෙවියන්වහන්සේගේ යහපත්කමට ඇති සාක්ෂිය නම් ප්‍රීතියයි. ***(ක්‍රියා 14:17)***

ස්වාමීන්වහන්සේ අපට ස්වර්ගයෙන් වර්ෂාවද සෑම කාල වේලාවටම ධාන්‍ය අස්වැන්නද උන්වහන්සේ කරුණාව කරණකොට ගෙන ලබා දෙමින් අපට ඇති තරම් ආහාරද සපයා දෙමින් අපගේ හදවත් ප්‍රීතියෙන් පුරවා තිබේ.

බොහෝ දෙනෙක් මෙම ප්‍රීතිය හා සංතෝෂය යන කාරණා දෙක පටලවාගෙන ඇත. මේ කාරණා දෙක ගැන මා යම් යම් දේ සොයා බැලූ අතර ඒ ගැන පහත කරුණු මා සඳහන් කරමි.

▲ ප්‍රීතිය යනු කුඩා ලෝකයකි. සංතෝෂය යනු විශාල ලෝකයකි.

▲ ප්‍රීතිය යනු හදවත තුළින් පැන නගින්නාවූ දෙයක් වන අතර සංතෝෂය මුහුණෙන් ප්‍රකාශ කරයි.

▲ ප්‍රීතිය ආත්මයෙන්ම දැනෙන අතර සංතෝෂය එම මොහොතට පමණි.

▲ ප්‍රීතිය ඉක්මවායන අතර සංතෝෂය යනු ප්‍රති ක්‍රියාවකි.

▲ ප්‍රීතිය සමාදානය හා තෘප්තිය ගෙන දෙයි.

▲ ප්‍රීතිය යනු ඇතුලාන්තය තුළින් ගලායන දෙයක් හා සතුට වැළඳගැනීමකි.

▲ ප්‍රීතිය යනු ක්‍රියාකාරී හැසිරීමකි. සංතෝෂය අප ළඟට පැමිණ නැවත හැරී යයි.

▲ ප්‍රීතිය දේව වචනයට අනුකූලයි. කනස්සලු නොවී ප්‍රීතිවෙයි. සංතෝෂය යනු කස්සලු නොවී සතුටු වීමයි.

▲ ප්‍රීතිය යනු ඇතුලාන්තයෙන් පැමිණෙන හැඟීමකි. සංතෝෂය පිටස්තරයෙන් පෙන්වන්නාවූ දෙයකි.

▲ ප්‍රීතිය සෑම අමාරුකම්, සෝදිසි හා කරදර වලින් අපගේ අරමුණ තේරුම්කර දෙයි.

නිතරම සමාදානය හා ප්‍රීතිය යන දෙකම එකට ගමන් කරයි. සමාදානය ඇති ස්ථානයෙහි ප්‍රීතිය ඇත. ප්‍රීතිය ඇති ස්ථානයෙහි සමාදානය ඇති, මේ කාරණා දෙකම තිබෙන විටදී දෙවියන්වහන්සේගේ යහපත්කම කරණකොටගෙන ප්‍රීතිය පැමිණෙන්නේය. අපව ප්‍රීතියෙන් පුරවන බවට උන්වහන්සේ පොරොන්දු වෙයි.

*6 වෙනි පිටුවට....*

**NEHEMIAH BIBLE**
**RESIDENTIAL / EVENING COLLEGE,**
Velachery / Chepauk & Santhoshapuram, Chennai.
Medium : Hindi / Tamil
*Registered Candidate for Membership*
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders & Senior Pastors for the past 54 years
**Certificate in Ministry**
**Diploma in Theology**
Qualification : 10th Standard & above
**Rush for admission!**
**Contact : The Chairman, Nehemiah Bible College.**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ජන:19-** නත්තල් දේව මෙහෙය සහ නව අවුරුදු උදාවේ දේව මෙහෙය සාර්ථක වීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:20-** යාච්ඤා සේවය, ඇදහිල්ලේ සේවය මහා නියෝගය ඇතුළු සෑම සේවයකටම සම්බන්ධ සහායකයන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:21-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු සියලුම දේව සේවකයන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:22-** "රැග්ලෝබල් විෂන් ෆෝ යූත් ඇන්ඩ් කිඩ්ස් කෙයා" රැ සේවය ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:23-** කැඳවීමේ ප්‍රතිරාවය U Tube සමාජ ජාලයට සම්බන්ධ සියලුම සේවා ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:24-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහල, නෙහෙමියා බයිබල් විදුහල, දේවධර්ම පාඨමාලාව ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:25-** භාෂා 16කින් මුද්‍රණය වන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය, මුද්‍රණාලය සහ එහි ක්‍රියාකාරකම් ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:26-** පසුගිය මාසයේ සියලුම මූල්‍යමය අවශ්‍යතා සපයා දුන් දෙවිඳුන්ට ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:27-** සේවයේ යෙදීසිටින සියලුම මිෂනාරිවරුන් සහ ඔවුන්ගේ පවුලේ අය ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:28-** දේව සේවය ව්‍යාප්ත කිරීම පිනිස සෑම් සෙල්වරාජ් දේවගැතිතුමා පුද්ගලිකව කරන කැපවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:29-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ සියලුම සේවකයන්ගේ පවුලේ අයට දිව්‍යමය ආරක්ෂාව ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:30-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ 2024 දින දර්ශනය සම්පූර්ණ කිරීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:31-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය නපුරු බලවේග වලින් ආරක්ෂා කිරීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**පෙබ:01-** යාච්ඤාවෙන් සහ මූල්‍යමය උපකාර සැපයීමෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවය ඉදිරියටත් කරගෙන යාමට උපකාරීවූ සෑම දෙනා ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**පෙබ:02-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ සියලුම සහකාර කතෘවරුන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**පෙබ:03-** සෑම කිතුණු සභාවකම දේව බලය අංග සම්පූර්ණව ක්‍රියාත්මක වීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**පෙබ:04-** දේශයේ සියලුරැම කිතුණු සංවිධාන සහසහ කිතුණු දේවස්ථාන ගැන යාච්ඤා කරන්න.

**පෙබ:05-** දේව සේවයේ යෙදී සිටින සියලුරැම සේවකයන් ගැන යාච්ඤා කරන්න.

**පෙබ:06-** නෙහෙමියා බයිබල් විදුහලේ නේවාසික සිසුන්ගේ ආරක්ෂාව ගැන යාච්ඤා කරන්න.

**පෙබ:07-** කැඳවීමේ ප්‍රතිරාවය U Tube සමාජ ජාලය ඔස්සේ පාස්ටර් සෑම් සෙල්වරාජ් විවිධ ජාතීන්ට ලබාදෙන සේවය ගැන යාච්ඤා කරන්න.

**පෙබ:08-** නෙහෙමියා බයිබල් විදුහලේ ගුරුවරුන් සහ පරිවර්තකයන් ගැන යාච්ඤා කරන්න.

**පෙබ:09-** පලස්තීනය සහ ඉශ්‍රායෙලය අතරත් රුසියාව සහ යුක්‍රේනය අතරත් සාමය ඇතිවන පිනිස යාච්ඤා කරන්න.

**පෙබ:10-** නෙහෙමියා බයිබල් විදුහලේ පුස්තකාල පොත් කෝහා මෘදුකාංගය තුළ සකස්කිරීම පිනිස යාච්ඤා කරන්න.

**පෙබ:11-** පාස්ටර් සෑම් සෙල්වරාජ්ගේ පවුලේ අයගේ ආරක්ෂාව ගැන යාච්ඤා කරන්න.

**පෙබ:12-** ලෝක ආර්ථික අවපාතය අඩුවන පිනිස යාච්ඤා කරන්න.

**පෙබ:13-** මිෂනාරිවරුන් සහ දේව සේවකයන් වෙත පමුණුවන හිංසා පීඩා නැතිවී යන පිනිස යාච්ඤා කරන්න.

**පෙබ:14-** කාන්තාවන් සහ දරුවන් වෙත එල්ලවන පීඩාවන් නැතිවී යන පිනිස යාච්ඤා කරන්න.

**පෙබ:15-** පාස්ටර් සෑම් සෙල්වරාජ්ගේ ජීවිත කථාව ලිවීම සම්පූර්ණ වන පිනිස යාච්ඤා කරන්න.

**පෙබ:16-** දේශයේ තරුණ තරුණියන් ගැන යාච්ඤා කරන්න.

**පෙබ:17-** 2024 වර්ශයට අවශ්‍ය ආර්ථික උපකාර ලැබෙන පිනිස යාච්ඤා කරන්න.

**පෙබ:18-** කොරෝනා වෛරසයෙ නව ප්‍රභේද පැතිර නොයන පිනිස යාච්ඤා කරන්න.

4 පිටුවෙන්....

***"....ස්වාමීන්වහන්සේ කෙරෙහි ප්‍රීතිවීම නුඹලාගේ ශක්තියයි.." (නෙහෙමියා 8:10)***

යක්ෂයා ඒවට කථා කලාක් මෙන් අපවද සෝසදිකර දෙවියන්වහන්සේ අපට නියමකර දී තිබෙන දේ තුළින් අපව නොමඟට ඇරීමට යක්ෂයා නිතරම වෑයම් කරයි. එම නිසා යක්ෂයා අපගේ ජීවිත වලට විවිධ දේ ගෙනෙයි.

## 1. අතෘප්තිය

දෙවියන්වහන්සේ පොරොන්දු වූ දේ ගැන ඒව තෘප්තියට පත්වූයේ නැත. දෙවියන්වහන්සේගේ යහපත්කමට ඇති පළමු සතුරා නම්, අතෘප්තියයි. අප සමහර විටදී "අර දේ මට තිබුනා නම්, මට තවත් දේ වැඩිය තිබුණානම්" ආදී වශයෙන්, පවසමින් අපට දෙවියන්වහන්සේ දුන්නාවූ දේ ගැන අතෘප්තිය ප්‍රකාශ කරයි. අපට දෙවියන්වහන්සේ ගැන බලාපොරොත්තුවක් තිබේ නම්, අප අතෘප්තියට පත්වන්නේ නැත. ***රෝම 15:13 හි මෙසේ පවසයි. "ඉදින් ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන් නුඹලා අධික බලාපොරොත්තුවෙන් යුක්තව සිටින පිණිස, බලාපොරොත්තුවේ දෙවියන්වහන්සේ ඇදහිල්ලෙන්වූ සියලු ප්‍රීතියෙන්ද සමාදානයෙන්ද නුඹලා පූර්ණකර සේක්වා."***

අතෘප්තිය අපගේ ප්‍රීතිය සොරා ගනියි. අප දෙවියන්වහන්සේගේ යහපත්කම් තුළින් උන්වහන්සේගේ පොරොන්දු තුලත් තෘප්තියට පත්විය යුතුය. අපට දෙවියන්වහන්සේ දුන් දේ ගැන අප තෘප්තියට සතුටු විය යුතුයි. අපට තිබෙන්නාවූ දේ ගැන ගුණවන්ත සිතින් සෑහීමට පත්වී මේ වසර තුල ජීවත් වෙමු.


## 2. කලකිරීම

යක්ෂයා අපගේ ප්‍රීතිය විනාශ කිරීමට පාවිච්චි කරන්නාවූ තවත් ආයුධයක් නම්, කලකිරීමයි. අපට බලාපොරොත්තුවක් තිබෙන විට කලකිරීමක් එතැනට පැමිණෙනු ඇත.

අප නිතරම දෙවියන්වහන්සේගෙන් කිසියම් දෙයක් ලබා ගන්නා පිණිස බලාපොරොත්තු වී එම එම බලපොරොත්තුව එලෙසින්ම ඉෂ්ඨ වෙන්නය කියා යාච්ඤා කරමු. අපගේ බලාපොරොත්තුව ඉෂ්ඨ නොවූ විට අප කලකිරීමටත් අධෛර්‍යයටත් පත්වෙනු ඇත. අප මුහුණදෙන්නාවූ අවස්ථාවන් ගැන බොහෝ සේ කල කිරෙයි. උදාහරණයක් ලෙස අප නියුතු වී සිටින්නාවූ රැකියාවේ කිසියම් උසස්වීමක් ගැන අප ආශාවෙන් බලාපොරොත්තු වී ඒ උදෙසා යාච්ඤා කරනවා ඇත. ඒ උසස්වීම අපට ලැබුණ විටදී ඒ සමගම රැකියාවේ වගකීම් හා අභියෝගයන්ද අපට වැඩි වී අප බොහෝ පීඩනයට පත්වෙනු ඇත. එවිට අප, "මා හිතුවේ නැහැ මේවගේ වෙයි කියා, අපරාදේ මම මේක භාරගත්තේ" කියා පවසමින් කල කිරීමට පත්වෙනු ඇත.

අපට ඇතිවෙන්නාවූ පීඩාකාරී අවස්ථාවන් වලදීත් අපගේ බලාපොරොත්තු සුන්වන විටදීත් අප වැලපෙමෙන් දොස් පවරනු ඇත. අපගේ ප්‍රීතිය හා සමාදානය නැති වෙයි. අප ක කිරීමට පත්වෙයි. මේ ගැන දෙවියන්වහන්සේ සතුටුවන්නේ නැත.

ඉශ්‍රායෙල් සෙනඟ වසර 430 ක් පුරා මිසරයේ වහල්කමින් සිටීමට සිදු විය.



*A Pillar of Cloud and Fire*

දෙවියන්වහන්සේ ඔවුන්ව මිසරයෙන් පිටතට ගෙන දිවා කාලයේදී වලා ටැඹකින්ද රාත්‍රී කාලයේ දී ගිනි ටැඹකින්ද මගපෙන්වෙනු ලැබීය. (නික්මයාම 13:21) ඔවුන් ඉතාම ප්‍රීතියෙන් හා සතුටෙන් (නික්මයාම 15 වන පරිච්ඡේදයෙහි) දෙවියන්වහන්සේට ප්‍රශංසා කලේය.

මතකතබාගන්න, ඔබ දෙවියන්වහන්සේට ලංවෙන විටදී යක්ෂයා ඔබට මහත් අභියෝග ගෙනෙන බව ඉශ්‍රායෙල් සෙනඟ දින තුනක් වතුර නොමැතිව විශාල අභියෝගයන්ට මුහුණ දුන්නේය. (නික්මයාම 15:22) ඔවුන්ගේ ප්‍රශංසාවෙන් පසු දැන් ඔවුන් දෙවියන්වහන්සේට දොස් නැගීමට පටන්ගත්තා. දෙවියන්වහන්සේ ඔවුන්ට කළාවූ යහපත් දේ ඔවුන්ට අමතක වූවා. ඔවුන්ව වහල්කමෙන් මුදවා ගෙනා ආකාරය අමතක වූවා. දෙවියන්වහන්සේගේ යහපත් ක්‍රියාවන් ඉතා ඉක්මනින්ම ඔවුන්ට අමතක වූවා.



*They started to complain*

***ඔවුන් කොඳුරන්නට පටන්ගත්තා, (නික්මයාම 15:24)*** අපත් මේ ආකාරයට කෙතරම් කොඳුරා තිබේද? ඔවුන්ට දින තුනක් වතුර නොලැබුන නිසාත් බලාපොරොත්තු අහිමි වූ නිසාත් ඔවුන් කලකිරුනි. එනම්, කලකිරීම පැමිණෙන විට අපගේ ප්‍රීතිය හා සමාදානය නැතිවෙයි.

නමුත් දෙවියන්වහන්සේගේ මාර්ගය අපගේ සිතුවිලි වලට වඩා ඉතා මහත්ය. උසස්ය. ඔවුන්ගෙ කෙඳිරීම මධ්‍යයේදීත් දෙවියන්වහන්සේ ඔවුන්ට වතුර

ලැබෙන පිණිස එක ළිඳක් නොව ළිං දොළොසක් සූදානම් කර තිබුණි. එය සෑම ගෝත්‍රයකට එක බැගින්ය කියා මා විශ්වාස කරමි. ඔවුන් තුල තිබූ කලකිරීම කරණකොටගන දෙවියන්වහන්සේගේ සැපයීම ඉතා මහත්ව තිබූ නිසා ඔවුන්ට වතුර තිබූ ස්ථානයෙහි කඳවුරු බැඳ ගැනීමට හැකි විය.


*Twelve wells with seventy palms*

අප දෙවියන්වහන්සේගේ වචනය දෙස බලන විට සෑම බලවත් දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙක්ම කලකිරීමක් තුළින් යාමට සිදුවිය. ආබ්‍රහම්, නෝවා, යාකොබ්, සාමුවෙල්, ඒලි, හන්නා, යෙරමියා, දාවිත්, යෝබ්, නෙහෙමියා, පේතෘස්, පාවුල් සහ තවත් බොහෝ බලවත් පුද්ගලයින් දේව රාජ්‍යයේදී මෙවැනි කලකිරීම් සහ සිත් කැඩීම් අත්දැක්කේය. මෙවැනි සෝසඳි කිරීම් තුළින් ඔවුන්ගේ ඇදහිල්ල සෝසඳි කර දෙවියන්වහන්සේ තුළ ඉතා ගැඹුරු වූ අත්දැකීම් තුළට යාමට සිදුවිය. ඔවුන්ගේ කල කිරීම මධ්‍යයේ දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සැලැස්ම ඉෂ්ඨ කලේය. ඒ දෙයම මේ නව වසරේදී උන්වහන්සේ ඔබටද කිරීමට හැකිය. ඔබගේ සියලු කලකිරීම් මධ්‍යයේ සිත් රිදීම් තුළ දෙවියන්වහන්සේට අනර්ග සැලසුමක් ඔබ ගැන තිබේ. අද දවසේදී ඔබ කලකිරීමට පත්වී සිටිනවාද? ඔබ කැඩුනාවූ බිඳුනාවූ ස්ථානයක සිටිනවාද? ස්වාමීන්වහන්සේගේ සැනසීම ඔබට ස්ථිරයි. උන්වහන්සේ තිරය පිටුපස සිට ක්‍රියා කරන බැවින් බලාපොරොත්තුව අතහැර නොගන්න. උන්වහන්සේගේ දිව්‍යමය සැලැස්මට ඔබට ඇතුලත් කර ඇති නිසා උන්වහන්සේ ඔබව අමතක කරන්නේ නැත. දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයේ ආරම්භකල දේ උන්වහන්සේ සම්පූර්ණ කරන සේක.

## 3. අධෛර්‍යමත්කම

දෙවියන්වහන්සේගේ යහපත්කම අපගේ ජීවිතයෙන් සොරා ගැනීමට යක්ෂයා පාවිච්චි කරන්නාවූ තුන්වන ආයුධය නම් අධෛර්‍යමත්කමයි.

මාර්තා සහ මරියාගේ කථාවෙන් මෙය අපට ඉතා හොඳින්ම පැහැදිලි වෙයි. මාර්තා සහ මරියා යේසුස් වහන්සේට මෙසේ පැවසුවේය. ***''....ස්වාමීනි, ඔබ මෙහි සිටිසේක් නම්, මාගේ සහෝදරයා මැරෙන්නේ නැත.'' (යොහාන් 11:32)*** සමහර අවස්ථාවන් වලදී දෙවියන්වහන්සේ අපට යම් යම් දේ නැතිවීමට ඉඩදී එම අත්දැකීම් අපට ලබා දෙනු ඇත. සමහර විට අප ඉතා ප්‍රේම කරන්නාවූ අය වීමට පුළුවනි. අපගේ සමහර අයට පසුගිය වසරේදී මෙලෙස යම් යම් දේ අහිමි වූ අත්දැකීම් තුල යන්නට ඇත. එය අපව අනිවාර්යෙන්ම අධෛර්‍යයට පත්කරනු ලබයි. ඔබ මෙයට ඉඩ දුන්නේ ඇයි? කියා අපි දෙවියන්වහන්සේ ගෙන්ද ප්‍රශ්න කරයි. මගේ යාච්ඤාවට පිළිතුරු නොදුන්නේ ඇයි? කියා අසමින් අප අධෛර්‍යයට පත් වෙයි. දේව වචනයෙහි, ***යේසුස්වහන්සේ ඇඬූසේක කියා පවසයි. (යොහාන් 11:35)***


***Martha and Mary complained to Jesus Christ!***

අපගේ වේදනාවන් තේරුම්ගැනීමට හැකි උත්තම පූජකයෙක් අපට සිටී. අපගේ කඳුළු, වේදනා සිත් කැඩීම් දන්නාවූ උතුම් පූජක යේසුස් වහන්සේ අපට සිටී. ***''අපට සිටින්නේ අපේ දුර්වලකම්වලදී අපේ දුක නොදැනෙන උත්තම පූජකයෙක් නොව, පව් කිරීමක් නැතුව, සියලුම ආකාරයෙන්ම අප වාගේ පරීක්ෂාකරනු ලැබූ උත්තම පූජකයෙක්ය.''*** *(හෙබ්‍රෙව් 4:15)*

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

**The Chairman, Nehemiah Bible College,** Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.


Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**"...කියවන්නා තේරුම් ගනීවා...."** *(මතෙව් 24:15)*



## චෙන්නෙයි ප්‍රදීපාගාරය!

## CHENNAI LIGHT HOUSE!

මීට වසර ගණනාවකට පෙර මාගේ සේවය තුළ මා ඉතාම පීඩා කාලයක් තුළ ගමන් කලෙමි. එවැනි අවස්ථාවේදී මගේ මනස තුළ බොහෝ ප්‍රශ්න පැන නැගුනි. එම අවස්ථාවේදී මට සිතුන දේ නම්, මාත් මේ ලෝකයේ ජීවත්වෙන්නාවූ අනෙක් මනුෂ්‍යයන් මෙන් ජීවත් වූවානම් මට මෙවැනි ප්‍රශ්නයක් නැති වෙයි. මා සේවයට ආව නිසයි මේ සියලු කරදර කියා සිතුවෙමි. මා එසේ සිතා එදා සේවය අතහැර තිබුණා නම්, මට කුමක් වී තිබුනාද කියා මා නොදනිමි. එහෙත් මා කිසි විටෙක මගේම කල්පනාවෙන් මගේම මාර්ග තුලින් ප්‍රශ්න විසඳීමට ගියේ නැත. කුමන ප්‍රශ්න, ආර්ථික ආමාරුකම් මට විරුද්ධව තිබුණත් දෙවියන්වහන්සේගේ දාසයෙක් හැටියට මගේ මුළු ජීවිතයෙන්ම උන්වහන්සේට අවංකවම සිටිය යුතුයි කියා මා සිතුවෙමි.

මෙවැනි සිතුවිල්ලක් සමඟ 1976 වන වර්ෂයේදී රාත්‍රී 10.00 ට පමණ මෙරීනා මුහුදු තීරයේ තිබූ චෙන්නෙයි ප්‍රදීපාගාරය ළඟට ගොස් යාච්ඤා කිරීමට පටන්ගත්තෙමි ඒ දවසේදී මට උපකාර කිරීමට කිසිවෙක් සිටියේ නැත. හැම කෙනෙක්ම මාව අත්හරිනු ලැබුවේය. මගේ ඇස් එම ප්‍රදීපාගාරය දෙස බලා සිටියෙමි.

එම ප්‍රදීපාගාරය තුළින් නිකුත් වූ ආලෝකය කැරකී කැරකී මහ මුහුද මැද යන නැව් වලට මඟපෙන්වන ආකාරය මා දුටුවෙමි. මේ ආලෝකය කැරකෙන විටදී තප්පර 15 ක් ආලෝකය විහිදෙන අතර තව තප්පර 10 කට කරුවල වෙයි.

## ඔබගේ ජීවිතයේ අඳුර ඉක්මනින්ම ආලෝකයට හැරෙයි !



මා මෙය ඉතා හොඳින් අවධානයෙන් බලා සිටින විටදී ආලෝකය හා අඳුර කැරකෙන විට මට අලුත් අත්දැකීමක් ලැබී මා ධෛර්යයමත් වන බව මට දැනුනි. මෙහිදී දෙවියන්වහන්සේගෙන් මට ඉතා පැහැදිලි පණිවිඩයක් ලැබුණි. එනම් ඔබගේ ජීවිතයේ තිබෙන අඳුර ඉතා ඉක්මනින්ම බලවත් ආලෝකයකට හැරෙන බවයි.

ප්‍රිය මිත්‍රය, ඔබ ඉතා වේදනාකාරී භයානකවූ තත්වයක අද සිටිනවාද? අධෛර්‍යය නොවන්න. ආලෝකය හා අඳුර එයි, නැවත යයි. නමුත්, ස්වාමීවූ යේසුස් වහන්සේ ඔබගේ ජීවිතය කෙරෙහි ස්ථිරව සිටියි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඊයේත් අදත් හෙටත් සදාකාලයටම ඒකාකාරයි. අපගේ මුල් පියවරු වූ ආබ්‍රහම්, ඊසාක් හා යාකෝබ් දෙවියන්වහන්සේ ඔබගේ දෑත අල්ලාගෙන ඔබව ආරක්ෂා කරමින් මුදවන සේක. ස්වාමීන්වහන්සේ පමණක් විශ්වාස කරන්න !

*******

ඔබ අඬන විට යේසුස් වහන්සේත් අඬයි. ඔබ යන වේදනාව යේසුස් වහන්සේට දැනෙයි. ඔබගේ පරීක්ෂා වලදී උන්වහන්සේ ඔබත් සමඟ සිටී. එම පරීක්ෂාව ඔබට ඇදහිල්ල ගෙන දෙන බවත් දෙවියන්වහන්සේ දනී. එම නිසා අධෛර්‍යය නොවන්න. යේසුස් වහන්සේත් බෙතානියට යාම ප්‍රමාද කලේය. මන්ද උන්වහන්සේ අපගේ ඇදහිල්ල ධෛර්‍යමත් කිරීමටත් උන්වහන්සේ අපගේ ජීවිතයේ කතුවරයා කියා පෙන්වීමටත්ය. ***"....නැවත නැගිටීම ද ජීවනයද මමය...."*** *(යොහාන් 11:25)*

මේ සත්‍යතාවය ප්‍රකාශ කිරීමට නම්, කිසියම් කෙනෙක් මැරෙන්නට අවශ්‍යයි. එනම්, සහෝදරයෙක්, මිත්‍රයෙක්, පුතෙක්, ස්වාමී පුරුෂයා නැතිනම් පියා යන අත්දැකීම තුළින් අපට ඉගැන්වීමට ස්වාමීන්වහන්සේට පුළුවනි.

අධෛර්‍යමත් නොවී උත්සාහවන්තයෙක් වීමට දේව වචනය මෙසේ පවසයි. ***"මාගේ සහෝදරයෙනි, නුඹලාගේ ඇදහිල්ල සෝදිසිකිරීමෙන් ක්ෂාන්තිගුණය උපදින බව දැන අනේකාකාර පරීක්ෂාවලට වැටෙන කල, ඒ සියල්ල ප්‍රීතියක්යයි සිතාපල්ලා."*** *(යාකෝබ් 1:2-3)* අපගේ ඇදහිල්ල අප අත් නොහැර සිටිය යුතුයි.

## PLEASE PRAY FOR OUR MINISTRIES AT THE HEAD QUARTERS

1. Prayer Service : 24 hours
2. **BIBLECOR** - Bible Correspondence Courses : English, Tamil & Hindi
3. **ECHO OF HIS CALL** - Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press - Publications
11. St. Paul's Matriculation School - Village English High School
12. Sunday Schools : 8.30 a.m. & 4.00 p.m. Sunday
13. **Tamil Services : 8.00 a.m. & 10.00 a.m. Sunday**
14. **Hindi Service : 4.00 p.m. Sunday**
15. **Telugu Service : 5.00 p.m. Sunday**
16. **English & Tamil Service : 6.00 p.m. Sunday**
17. Women's Prayer : 5.30 p.m. Wednesday
18. Men's Prayer : 7.00 p.m. Friday
19. Discipleship Meeting : 6.00 p.m. Saturday
20. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
21. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
22. Ministers Review Meeting : 5.30 p.m. First Saturday
23. Parents' Prayer : 4.00 p.m. First Sunday
24. Night Prayer : 9.30 p.m. Second Friday
25. Fasting Prayer : 9:30 a.m. Third Saturday
26. Holy Communion : Second Sunday Services
27. Youth / Kid Prayer : 10.00 p.m. daily
28. Staff Devotion : 9.00 a.m. daily
29. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

මෙම වර්ෂයේදී පසුගිය කාලයන් තුල ඔබ අත් හැරියාවූ දේ නැවත ආරම්භ කිරීමට ස්වාමීන්වහන්සේ ඔබට උපකාර කරන සේක. මෙම වසර ඔබගේ ජීවිතය ගොඩනගන්නාවූ වසරක් වේවා. ඔබගේ ජීවිතයේ සම්පූර්ණ නොවූ සෑම දේම සම්පූර්ණ වන සේක.

ඔබ මුහුණදෙනු ලබන පරීක්ෂා මැද දෙවියන්වහන්සේ ගමන්කරන සේක. ඔබගේ පරාජයට ලැජ්ජාව, අසාර්ථකවීම් යන සියල්ල මධ්‍යයේ ගිනිමැදදී ගමන්කල හතරවන තැනැත්තා ලෙස උන්වහන්සේ ඔබ සමඟ සිටී. මේ වර්ෂය ඔබගේ උත්සාහයේ නිසි ප්‍රතිඵල දකින්නාවූ වසරක් වේවා.

ප්‍රිය සහෝදරයා සහෝදරිය, ඔබ පරීක්ෂාවන් හා අධෛර්‍යයකම් වලට මුහුණ දෙන විට ඔබගේ දුක අධික නිසා ඔබගේ සමාදානයත් ප්‍රීතියත් නැතිවන විටත් ඔබ බලාපොරොත්තු වූ ආකාරයෙන් දේවල් සිදු නොවන විටත් දේව වචනයෙහි උගන්වන ආකාරයට අපට මහත්වූ ප්‍රීතියක් ඉදිරියේදී තිබන බව බලාපොරොත්තු වන්න. මේ සියල්ල තුළින් ගමන් කලාවූ ප්‍රධාන පූජකයෙක් අප සමඟ සිටී. ඔබ ගිණි මැදින් යන විට ඔබ සමඟ තවත් කෙනෙක් සිටී. දෙවියන්වහන්සේගේ යහපත්කම ඔබට සමාදානයේ ප්‍රීතියත් ගෙනදෙන සේක. මන්ද උන්වහන්සේ සමාදානයේ කුමාරයාය.

ඔබ තනියම නොවෙයි. මන්ද ඔබ කිසි දෙයකට තනියම මුහුණදීමට අවශ්‍ය නැත.

අතහරින්න එපා. ඔබ වැටී සිටිනවානම් නැගී සිටින්න.

යක්ෂයාගේ බොරුවට ඇහුම්කන් නොදෙන්න. දෙවියන්වහන්සේ ඔබ ගැන සියලු දේ දනී. උන්වහන්සේ යහපත් වූ දේ පමණක් ඔබට කරයි.

*******

RNI NO. TN/SIH/2006/17846

## NEED LIBRARY BOOKS

We are in need of **Tamil, English and Hindi books** for our Libraries at **St. Paul's Matriculation School and Nehemiah Bible Colleges.** If you have new or old books in good condition and If you have new or old books in good condition and are willing to donate, please get in touch with us.

- Pr. S. Sam Selva Raj, Editor
+91-98412 71858

## URGENT

We need about 1000 Hindi Christian Books for our Nehemiah Bible Colleges. Please inform us the possibility of procuring the theological Hindi books.

- Pr. S. Sam Selva Raj, Editor
+91-98412 71858

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 2nd **JANUARY 2024.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**